# ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිමැවුම් වලට යොදා ගන්නා ද්‍රව්‍ය වල තිබිය යුතු ගුණාංග

**දෙවන පාඩමේ (2 කොටස)**

1) ගඩොලක ඔබ දන්නා ගුණ තුනක් සඳහන් කරන්න

- යාන්ත්‍රික ගුණ
- භෞතික ගුණ
- කල්පවත්නා බව

2) ගඩොලක ඇති භෞතික ගුණ තුනක් දක්වා ඒවා හඳුන්වන්න.

- හැඩය

ඝණකාභයක හැඩය ගනී එහි සෘජු දාන හා සෘජු මුළු වලින් යුක්තය

මතුපිට පෘෂ්ඨය සමතලය

## වර්ණය

පුළුස්සා ගත් මැටි ගඩොල් රටට හුරු දුඹුරු පැහැයකින් යුක්තය තද දුඹුරු පැහැති ගඩොල් පිරිස් වී වැඩි වන අතර ලා කහ පැහැයෙන් යුත් ගඩොල් පිරිස් වී අඩු නිසා හඳුනා ගැනීම පහසුය.








## ප්‍රමාණය

ඉංජිනේරු බඩ ලක්ෂණ හා ප්‍රමිතියෙන් යුතුව මිනුම් ඇත




## ඝනත්වය

ගඩොලක ඝනත්වය 1600-1900³KG අතර විය යුතුය.

ගඩොල් ස්කන්ධය 3.2KG පමණ වෙයි

## කල්පැවැත්ම

හායි පැවැත්වීමට එහිදී කරුණු කිහිපයක් බලපා ප්‍රධාන වශයෙන් අමුද්‍රව්‍ය මැටි පිළිස්සී ඇති ප්‍රමාණය බලපායි.

# 3) ගඩොලක ජල ත්‍යාගීතාව හඳුන්වන්න

✍ ජලය අවශෝෂණය කරගන්නා හා ජලයේ දියවන ලවණ වර්ග සහිත මැටි භාවිතා කර ගඩොල් නිෂ්පාදනය කළ විට මෙම තත්වය ඇති වේ. ගඩොල් වල දක්නට ලැබෙන රතු දුඹුරු වර්ණය වෙනුවට දුර්වර්ණ ගතියක් මෙවැනි ගඩොල් වල දැකිය හැකිය



4) ගඩොලක ජල ත්‍යාගීතාව ඇතිවීමට බලපාන හේතු මොනවාද

- වැහි ජලය කාන්දු වීම.
- දැඩි උෂ්ණුසුම හා ජල වාෂ්ප සහිත කාලගුණික තත්ත්වයක් ඇතිවීම.

5) භාවිතයට යෝග්‍ය වන ලෝක තිබිය යුතු ලක්ෂණ ලියන්න.

- නියමිත දිග පළල උස යන විධි වලට අදාල විය යුතුය
- ගඩොල් දෙකක් එකට ගැටීමෙන් ලෝහ දෙකක් ගැටෙන ශබ්දය සමාන ශබ්දයක් නිකුත් විය යුතුය.
- ගඩොල් පැටවීමේදී ලැබෙන ප්‍රමාණය 7% කට අඩු විය යුතුය.

5) හිස්තැන් පුරවන්න

✍ ගඩොලක ඔලු මුහුණත පැත්ත බිමට පතිත වන සේ .......1.5M.....උසක සිට බිමට ඇහැ ඇරිය විට නොකැඩී තිබිය යුතුය. ගඩොලක්.......24...පැය ජලයේ ගිල්වා තැබූ විට උරා ගන්නා ජල ප්‍රමාණය ගඩොල් බරෙන්..15%...නොඉක්මවිය යුතුය.

## 6) කොන්ක්‍රීට් යන්න හදුන්වන්න.

රළු සමාහාර(ගල්), සියුම් සමාහාර(වැලි), බැඳුම් ද්‍රව්‍ය (සිමෙන්ති)යන ද්‍රව්‍යත් තුන යම්කිසි අනුපාතයකට අනුව ජලය සමග මිශ්‍ර කර සකස් කර ගත් ද්‍රව්‍යයකි .



+



7) වානේ වල හා කොන්ක්‍රීට් වල සමාන ගුණය කුමක්ද

- ප්‍රසාරණ සංගුණකය

8) කොන්ක්‍රීට් නිපැයුම් නිර්මාණය කරනු ලබන්නේ කුමන බලයන්ට ඔරොත්තු දෙන පරිදි ද

- සම්පීඩන ප්‍රත්‍යා බලය ( බරක් යෙදීමේදී මුල් හැඩය වෙනස් නොවීම)
- ආතතික ප්‍රත්‍යා බලය ( දෙ පසට ඇද විට නොකැඩී තිබීමේ හැකියාව)
- ව්‍යාකෘති ප්‍රත්‍යාබලය( කොටස් වලට වෙන් වීමට ඇති හැකියාව)